# ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල

# පුරප්පාඩු

## පින්තාරුකරු තනතුර / පෙදරේරු තනතුර

**ඉහත තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.**

**අධ්‍යාපන සුදුසුකම්** : අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (2) සහිතව විෂයන් (6) හයකින් සමත්වී තිබීම.

**වෘත්තීය සුදුසුකම්** :

I. ප්‍රාථමික ශ්‍රේණියේ (ශිල්පීය නොවන) සහ අර්ධ ශිල්පීය තනතුරක අවම වශයෙන් අවුරුදු 05කට නොඅඩු අඛණ්ඩ සතුටුදායක ස්ථිර සේවා කාලයක් තිබීම.

II. තනතුරට අදාලව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහතික 4 වන මට්ටම (NVQ4) නොඅඩු මට්ටමේ ප්‍රවණතා සහතිකයක් ලබා තිබිය යුතුය.

**පළපුරුද්ද** : රජය පිළිගත් ආයතනයක අදාල රාජකාරි පිළිබඳ අවුරුදු 05ක පළපුරුද්දක් තිබීම (සහතික මගින් සනාථ කළ යුතුය)

**වයස** : අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

**වෙනත්** : අයදුම් කළ හැක්කේ පිරිමි අයදුම්කරුවන්ට පමණි.

**වැටුප් කේතය** : PL2 - III ශ්‍රේණිය

**වැටුප් පරිමාණය** : රු. 34,090 - 10X365-37,740/- (මාසිකව)

II. ඉහත සඳහන් වැටුපට අමතරව සියලු අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

**සේවා කොන්දේසි** : ස්ථිර පදනම මත සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදලේ හිමිකම් සමග.

රජයේ සේවයේ තනතුරු දරන අයදුම්කරුවන් තම අයදුම්පත් තමන් සේවය කරනු ලබන ආයතන ප්‍රධානීන් මගින් සෘජුවම පිටපතක් යොමු කරමින් එවිය යුතුය. අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් නිදහස් කළ හැකි බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයක් අයදුම්පතට අමුණා තිබිය යුතුය.

තනතුරට පත් කර ගැනීමේ හෝ නොගැනීමේ අයිතිය ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහලේ පාලක මණ්ඩලය සතු වේ. අයදුම් කරන තනතුර කවරයේ ඉහළ වම්පස කෙළවරේ සටහන් කළ යුතුය. අයදුම්කරුවන් විසින් තමන්ගේ සම්පූර්ණ ජීව දත්තයන් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සමග 2024.09.09 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් අය වෙත යොමු කළ යුතුය.

**සභාපති,**
**ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල, තලපත්පිටිය, නුගේගොඩ.**
**2024.08.22**